මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213096<br>081-2213097 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/10/SUP/LIMITED - 2020 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.05. 17 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)**

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2021.05.13 දිනැති අංක 2, 228 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රය අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මාගේ සමාංක හා 2021.04.20 දිනැති ලිපියේ 02 ඡේදයේ අයදුම්පත් භාරගන්නා දිනය 2021.05.31 දක්වා දීර්ඝ කරනු ලැබේ. අදාල සංශෝධන අභ්‍යන්තර නිවේදනය www.psc.cp.gov.lk වෙබ් අඩවියේ ප්‍රදර්ශන කර ඇත.

02. එම ගැසට් නිවේදනය හා මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014.04.07 දිනැතිව අනුමත කරන ලද 2013.04.02 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව, ඔබ ආයතනයේ සේවය කරනු ලබන මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සුදුසුකම් ලත් නිලධාරීන් වෙතොත් ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරන ලද අයදුම්පත් 2021.05.31 වෙනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් මෙම කොමිෂන් සභාව වෙත එවන ලෙස කාරුණිකව දන්වමි.

03. පළමු වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් කිසිදු ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් ඉහත සඳහන් විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තුව රු. 600කි. මෙම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ මධ්‍යම පළාත් සභා ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙසය. මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවන ලෙස අයදුම්කරුවන් දැනුවත් කරන්නේ නම් මැනවි.

ටී.ජ්.ඩී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත් -

01. දිස්ත්‍රික් ලේකම් (මහනුවර/මාතලේ/නුවරඑළිය) - දැ.ගැ.පි
02. මධ්‍යම පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - ඉහත සඳහන් විභාගයට අදාළ විභාග ගාස්තු 2021.05.31 දින දක්වා භාර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දැන්වීම පිණිස

## <u>මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය - 2019 (2020)</u>

උක්ත විභාගයට අදාළ මාගේ අංක CPC/PSC/10/SUP/LIMITED - 2020 හා 2021.04.20 දිනැති ලිපියේ 02 වන ඡේදයේ හා විභාග නිවේදනයේ 7 (ආ) ඡේදයෙහි අයැදුම්පත් කැඳවන අවසාන දිනය පහත පරිදි සංශෝධන කෙරේ.

I. 7 (ආ) ඡේදයෙහි අයැදුම්පත් කැඳවන අවසන් දින **2021.05.31** දක්වා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව අයැදුම්කරුවන් 2021.05.31 දින වන විට ඉහත විභාග නිවේදනය මගින් අපේක්ෂිත සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

II. මෙම විභාගය සඳහා මේ වන විටත් අයැදුම්කර ඇති අයැදුම්කරුවන් නැවත අයැදුම්පත් එවීමෙන් වළකින ලෙස දැනුම් දෙනු ලැබේ.

III. ඉහත විභාග නිවේදනයේ සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2021.05.17 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.